# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2101/12 - 2018 දෙසැම්බර් මස 10 වැනි සඳුදා - 2018.12.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය* : MLB/LND/LNDAQ/L1/44-1.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4-3/9/2016/WS/519.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාලිම්බඩ ගමේ මු.පි.මාර/2756 පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන පහත සඳහන් ඉඩම මාතර iv වන අදියර ජල සම්පාදන ක්‍රමය යටතේ මාලිම්බඩ භූගත ටැංකියක් හා නිල නිවාසය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගෙන තිබේ.

**උපලේඛනය**

**කැබලි අංක 01**

ඉඩමේ නම: නාකන්දගොඩහේන; ඉඩමේ විස්තරය: වත්ත, අවුරුදු 30ක් පමණ වයසැති කුරුඳු පඳුරු ඇත; මුල් හිමිකම් කියන අය: වී.එස් කුමාරගේ මයා, ටැංකිය කඩේ, මාලිම්බඩ, පාලටුව; ප්‍රමාණය: හෙක්. 0.4957.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018.12.27 දින පෙ.ව. 10.30ට මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018.12.20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබා ගැනීම වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

දීපිකා කේ. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මාලිම්බඩ.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-713